Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

**විෂය - පෙරදිග සංගීතය**

**සතිය - 02**

**13 ශ්‍රේණිය**

**නිපුණතාවය 1.0 / නිපුණතා මට්ටම 1.4** **I කොටස** **පාඩම : හින්දුස්ථානි තාලපද**

**ප්‍රශ්න අංක 01 සිට 5 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01.ධ්‍රැවපද ගායන ශෛලිය හා බැඳි තාලපදය,
1. ත්‍රිතාල් 2.පංජාබ් 3. ඒක්තාල් 4. චෞතාල් 5. ධමාර්

02.විලම්බ හා අති විලම්භ යන ලය වල පමණක් වාදනය වන තාලය,
1. ඒක්තාල් 2. දීප්චන්දි 3. ජප්තාල් 4. තීන්තාල් 5.තිලවඩා

03.තිරිකිට යන අක්ෂරය දෙවරක් වාදනය වන තාල පද යුගලයකි,
1.ත්‍රිතාල් - දීප්චන්දි 2.ඒක්තාල්- තිලවඩා 3.ඒක්තාල් - රූපක්
4. තිලවඩා - පංජාබ් 5.ත්‍රිතාල් - ජප්තාල්

04.මාත්‍රා 12ක් සහිත තාලයක් සිව්වරක් වාදනය කිරීමේදී ලැබෙන මාත්‍රා ගණන,
1.ත්‍රිතාල් ආවර්ත 3කට සමානය. 2.රූපක් ආවර්ත 2කට සමානය. 3.ධමාර් ආවර්ත 2 ½ සමානය.
4. දීප්චන්දි ආවර්ත 3කට සමානය. 5.චෞතාල් ආවර්ත 3කට සමානය

05.පක්වාජ් අංගයෙන් වාදනය කරන තාල පද දෙකකි,
1. රූපක් - දීප්චන්දි 2. ඒක්තාල් - තිලවඩා 3. චෞතාල් - ත්‍රිතාල්
4. තිලවඩා - රූපක් 5. චෞතාල් - ධමාර්

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හිස්තැන් වලට සුදුසු පිළිතුර යොදන්න.**

06.විවෘතාංගයෙන් වැයෙන ........................ තාලයේ ආවර්ත දෙකකදී ලැබෙන මාත්‍රා ගණන 28කි.

07.විලම්බ ඛ්‍යාල් ගීතයක් සඳහා වාදනය කිරීමට යෝග්‍ය මාත්‍රා 12ක තාලයකි, ............................ .

08. .......................... තාලය තබ්ලා ඒකල වාදන සඳහා භාවිතා නොවේ

09.අති ධ්‍රැත ලයෙහි වාදනය වන තාල පද දෙකකි, ……………….. හා …………………… .

10.විභාගයක මාත්‍රා හතර බැගින් යෙදෙන …………………… තාලය ධුන් වාදන ශෛලිය සඳහා භාවිතා වේ.

**නිපුණතාවය 1.0 / නිපුණතා මට්ටම 1.4** **II කොටස** **පාඩම : හින්දුස්ථානි තාලපද**

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. පහත ගායන, වාදන ශෛලීන් සඳහා භාවිතා වන තාල පද නම් කරන්න.
    ධ්‍රැවපද, ඛ්‍යාල්, ධමාර්, තරාණා, භජන්, චතුරංග, ඨුම්රි, ධුන්, ගත්

02. සමාන මාත්‍රා සහිත නිර්දේශිත තාල පද තුනක් නම් කොට ඒවා අතර සම - විෂමතා දක්වන්න.